ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2325/54 - 2023 මාර්තු මස 31 වැනි සිකුරාදා - 2023.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**10 වන සංශෝධනය**

**ශ්‍රී ලංකා හෙද සේවයේ සේවා ව්‍යවස්ථාව**

2013 නොවැම්බර් 19 දිනැති අංක 1837/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පහත I කොටසේ සඳහන් පරිදි සංශෝධිත ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහය, පහත II කොටසේ දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,**
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2023 මාර්තු මස 31 වැනි දින,

**I කොටස**

සංශෝධන අංක 1 - 2014 සැප්තැම්බර් 23 දිනැති අංක 1881/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය.*
සංශෝධන අංක 2 - 2016 මැයි 11 දිනැති අංක 1966/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය.*
සංශෝධන අංක 3 - 2016 සැප්තැම්බර් 27 දිනැති අංක 1986/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය.*
සංශෝධන අංක 4 - 2017 ජුනි 07 දිනැති අංක 2022/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය.*
සංශෝධන අංක 5 - 2018 අගෝස්තු 27 දිනැති අංක 2086/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය.*
සංශෝධන අංක 6 - 2018 සැප්තැම්බර් 07 දිනැති අංක 2087/75 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය.*
සංශෝධන අංක 7 - 2020 පෙබරවාරි 25 දිනැති අංක 2164/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය.*
සංශෝධන අංක 8 - 2021 ජූලි 30 දිනැති අංක 2238/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය.*
සංශෝධන අංක 9 - 2021 අගෝස්තු 03 දිනැති අංක 2239/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය.*

1A - G 39229 — 07 (2023/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## II කොටස

10.1.1.1. හි (vi) 10.2.1.1. හි (iv) හි සඳහන් වගන්තිය වෙනුවට පහත වගන්තිය අදාළ වේ.
රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

20.2.2 III ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.
(අ) අංක 2164/13 හා 2020.02.25 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 20.2.2 වගන්තිය යටතේ සඳහන් කරුණ මේ යටතේ ඇතුළත් වේ.

(ආ) 2021.07.05 දින හෝ ඊට පෙර පූර්ව සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානය අනුව II ශ්‍රේණියට උසස්වීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති, එහෙත් එදිනට පෙර II ශ්‍රේණියට උසස් වී නොමැති නිලධාරීන්ට පහත විධිවිධාන අදාළ වේ.

පූර්ව සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානය අනුව II ශ්‍රේණියට උසස්වීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති දිනයේ සිට 2021.07.05 දිනය දක්වා වන සක්‍රීය හා සතුටුදායක සේවා කාලය I ශ්‍රේණියට උසස් කිරීමේ දී II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

20.2.4 I ශ්‍රේණියේ සිට අධි පන්තියට උසස් කිරීම.

(අ) 9 වන සේවා ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන 2021.07.05 දිනට පෙර I ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන්, I ශ්‍රේණියේ වසර 7ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට 10.3.1 (i) හි සඳහන් සුදුසුකම් හැර ඒ යටතේ වන අනෙකුත් සුදුසුකම් සලකා අධි ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(ආ) 9 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන 2021.07.05 දිනට පෙර II ශ්‍රේණියේ වසර 7ක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්, අධි ශ්‍රේණියට උසස් කිරීමේ දී I ශ්‍රේණියේ වසර 7ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිතව හෙද සේවයේ වසර 22ක ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට 10.3.1 (i) හි සඳහන් සුදුසුකම් හැර ඒ යටතේ වන අනෙකුත් සුදුසුකම් සලකා උසස් කරනු ලැබේ.

(ඇ) 9 වන සේවා ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන 2021.07.05 දින හෝ ඊට පෙර අධි පන්තියට උසස් වී ඇති නිලධාරීන්ගේ, උපරිම වසර 3ක කාලයකට යටත්ව I ශ්‍රේණියේ වසර 7කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලය එම නිලධාරීන්ගේ අධිපන්තියේ සේවා කාලය ලෙස සලකනු ලැබේ. කෙලෙසවුවද මෙම විධිවිධානයන් අනුව අධිපන්තියට උසස්වීම් ලබා දී ඇති දිනයේ වෙනසක් සිදුකරනු නොලැබේ.

EOG 03 - 0383

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.